මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.10.14
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් **தொலைபேசி/ தொலைநகல்** Telephone / Fax:- 041-2240208

# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# 2022.10.11 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිට්දූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

නොපැමිණීම:- ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝබර් මස මාසික සභා රැස්වීම 2022.10.11 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

## *01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.*

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>
2022.09.13 සභා වාර්තාවේ 10 පිටුවේ යෝජනාවේ "සුල්තානාගොඩ නා ගස " කියන එක "සුල්තානාගොඩ ගම්මඩුවට අයත් නුග ගසේ අවට නිවෙස්වලට හා පාසලට අවහිර අත්තක් කපා ඉවත් කිරීමට " ලෙස සංශෝධනය විය යුතුයි.

ඉහත සංශෝධනයට යටත්ව 2022 සැප්තැම්බර් මස 13 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව 2022.09.13 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.
2022.09.23 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව 2022.09.27 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.
2022.09.27 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව 2022.09.27 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02.සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

***03.සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය , මාතර මගින් එවන ලද "කි.මී.100,000ක් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- අංක 61/බී, නාකන්දගොඩවත්ත, තෙලිජ්ජවිල යන ලිපිනයෙහි එස්.කේ.ජයවර්ධන නැමති අය විසින් එවා තිබූ “පාර පිළිසකර කරවා ගැනීම සම්බන්ධවයි” යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.
- වෙළඳගොඩ ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර තිබූ “බෙල්පගොඩවත්ත වේල්ල සකස් කර ගැනීම” යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**

2022/09/08 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2022/09/08 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/09/13 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2022/09/13 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

2022/09/23 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

2022/09/23 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**

වගා පාළුවට ලක්වන කුඹුරු අස්වැද්දීම සඳහා ගොඩවී ඇති ඇළ මාර්ග සකස් කිරීමට රුපියල් ලක්ෂ 5 ක මුදලක් සභා අරමුදලින් වෙන් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඉදිරි සභාවට කල් තබන ලදී.

**<u>යෝජනා අංක 5:5</u>**

ප්‍රාදේශීය සභාව සතු තෙලිජ්ජවිල කඩකාමර සඳහා නව තක්සේරු කුළිය ලැබී ඇති බැවින් කඩ කුළී සංශෝධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:5</u>**

ප්‍රාදේශීය සභාව සතු තෙලිජ්ජවිල කඩකාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවා ඇති නව තක්සේරු කුළිය අංක 01,04,05 කඩකාමරවලින් අය කිරීමටත්, අංක 02 සහ 03 කඩ කාමරවලින් රු.1100.00ක් බැගින් වූ මාසික කුළියක් අය කිරීමටත් මෙම තීරණය 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 5:6</u>**

ප්‍රාදේශීය සභා පනතේ 160 වගන්තිය ප්‍රකාරව දේපල තහනමට ගැනීම සම්බන්ධව දේපල තහනම් කිරීමේ නිලධාරියෙකු ලෙස නිහාල් කරුණානායක මහතා සහ ටී.එච්.දිනේෂ් ප්‍රසන්න මහතා පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:6</u>**

ප්‍රාදේශීය සභා පනතේ 160 වගන්තිය ප්‍රකාරව දේපල තහනමට ගැනීම සම්බන්ධව දේපල තහනම් කිරීමේ නිලධාරියෙකු ලෙස නිහාල් කරුණානායක මහතා සහ ටී.එච්.දිනේෂ් ප්‍රසන්න මහතා පත් කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව පරිහරණය කරන පහත ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පවතින අතර තක්සේරු මුදල් ගෙවා සභාවට අත්පත් කර ගැනීමට හැකියාව ඇති බැවින් ඒවා සභාවට අත්පත්කර ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- හොරගොඩ පොදුවෙළඳපොළ
- විකුම්ගම ප්‍රජාශාලාව
- බොකුටුගහහේන ප්‍රජා ශාලාව
- අධිකාරිවිලගම ප්‍රජා ශාලාව

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව පරිහරණය කරන පහත ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පවතින අතර තක්සේරු මුදල් ගෙවා සභාවට අත්පත් කර ගැනීමට හැකියාව ඇති බැවින් ඒවා සභාවට අත්පත්කර ගැනීම සුදුසු බවට තීරණය විය.

- හොරගොඩ පොදුවෙළඳපොළ
- විකුම්ගම ප්‍රජාශාලාව
- බොකුටුගහහේන ප්‍රජා ශාලාව
- අධිකාරිවිලගම ප්‍රජා ශාලාව

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**

කද්දූව එච්.ඒ.මිතුල දරුවාගේ ශල්‍ය කර්මයක් සඳහා මිලියන 15ක පමණ ප්‍රමාණයක් අවශ්‍ය වී ඇති බැවින් ප්‍රාදේශීය සභාව මගින් ආධාරයක් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා

මේ ආකාරයේ රෝගීන් බලප්‍රදේශයේ සිටින බැවින් ඔවුන්ටත් මෙම ක්‍රමය යටතේ මුදල් දීමට සිදුවිය හැකි බැවින් මෙම යෝජනාව සම්බන්ධව තීරණයක් ගැනීමට නොහැකි විය.මෙවැනි අයට උපකාර කිරීම සඳහා බලප්‍රදේශයේ වෙන්දේසිකරුවන්ගෙන් සහ අනෙකුත් ව්‍යාපාරිකයන්ගෙන් අරමුදලක් රැස් කිරීම සුදුසු බවට ගරු විපක්ෂ නායක සමන් දෙනිපිටියගේ මහතා පැහැදිලි කරන ලදී.

**<u>යෝජනා අංක 6:2</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ බැකෝ ලෝඩර් ක්‍රියාකරු ලෙස සේවය කරන ඒ.වී.අමිල්උෂාන්ත මහතාට 2022 සැප්තැම්බර් මස සිට 01 සිට බැකෝ ලෝඩරයේ ක්‍රියා කරන දින සහ බැකෝ ලෝඩරයේ අලුත්වැඩියා කටයුතු සඳහා ගරාජය තුළ රැඳී සිටින දින සඳහා රු.2500.00ක බැගින්ද අනෙකුත් දිනවල රු.1300.00 බැගින්ද දෛනික දීමනාව ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:2</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ බැකෝ ලෝඩර් ක්‍රියාකරු ලෙස සේවය කරන ඒ.වී.අමිල්උෂාන්ත මහතාට 2022 සැප්තැම්බර් මස සිට 01 සිට බැකෝ ලෝඩරයේ ක්‍රියා කරන දින සහ බැකෝ ලෝඩරයේ අලුත්වැඩියා කටයුතු සඳහා ගරාජය තුළ රැඳී සිටින දින සඳහා රු.2500.00ක බැගින්ද අනෙකුත් දිනවල රු.1300.00 බැගින්ද දෛනික දීමනාව ගෙවීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:3</u>**

ආයුර්වේද දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන බෝ නොවන රෝග පරීක්ෂාව සඳහා අවශ්‍ය පහත උපකරණ මිළදී ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

Glucose strips
Cholesterol strips
Blood lancets
Cholesterol meter

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

අයුර්වේද මධ්‍යස්ථානයෙන් ඒ කටයුතු කරගෙන යනවා.දිගටම අපට උපකරණ සපයන්න විතරයි තියෙන්නේ.ජංගම සේවා පවත්වන ස්ථානවලත් අපට බෝ නොවන රෝග පරීක්ෂාව කරන්න පුලුවන්.ලොකු වියදමක් යන්නෑ.ගම් මට්ටමින් මේක කරන්න අවශ්‍ය නිසා අනුමත කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

ආයුර්වේද දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන බෝ නොවන රෝග පරීක්ෂාව සඳහා අවශ්‍ය පහත උපකරණ මිළදී ගැනීමට තීරණය විය.

Glucose strips
Cholesterol strips

Blood lancets
Cholesterol meter

**<u>යෝජනා අංක 6:4</u>**

ප්‍රාදේශීය ලේකම්ගේ අංක MLB/LND/LLEAS/L1/07 හා 2022.09.15 දිනැති ලිපිය අනුව තෙලිජ්ජවිල, අකුරුගොඩ, ගල්ඇන්දකුට්ටිය ඉඩම, රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම යටතේ ගනේගම බෝගොඩගේ සකුරා මිය වෙත ලබා දීමට සභාවේ එකඟතාවය ලබා දෙන ලෙස කළ ඉල්ලීම ගරු සභාවට ඉදිරිපත් කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

වගා කිරීමක් හෝ පදිංචියක් සිදුවී තිබේද කියල ග්‍රාම නිලධාරී මගින් මුලින්ම සනාථ කරගන්න.
ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

තෙලිජ්ජවිල, අකුරුගොඩ, ගල්ඇන්දකුට්ටිය ඉහත කී ඉඩමේ වගා කිරීමක් හෝ පදිංචියක් සිදුවී තිබෙන බවට ලබා ගන්නා ග්‍රාම නිලධාරී සහතිකය ලබා ගැනීමෙන් පසු රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම යටතේ ගනේගම බෝගොඩගේ සකුරා මිය වෙත එකී ඉඩම ලබා දීමට සභාවේ එකඟතාවය ලබාදීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:5</u>**

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාලය මාතර මගින් ඉල්ලීම් කර ඇති පරිදි හොරගොඩ මධ්‍යම බෙහෙත් ශාලාව පිහිටි ඉඩම දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස කළ ඉල්ලීම සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාලය මාතර මගින් ඉල්ලීම් කර ඇති පරිදි හොරගොඩ මධ්‍යම බෙහෙත් ශාලාව පිහිටි ඉඩම දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස කළ ඉල්ලීම අනුව හොරගොඩ බෙහෙත් ශාලාවට තිබිය යුතු භූමිය අතහැර අනෙකුත් භූමි ප්‍රමාණය සභාවට ලබා ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

රජයේ තක්සේරුව මත කිරිමැටිමුල්ල අධිකාරිවලගම මධ්‍යම බෙහෙත් ශාලාව පිහිටි ඉඩමේ පර්චස් 20ක භූමි ප්‍රමාණයක් සභාව වෙත පවරා ගැනීමට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

රජයේ තක්සේරුව මත කිරිමැටිමුල්ල අයිකාරිවලගම මධ්‍යම බෙහෙත් ශාලාව පිහිටි ඉඩමේ පර්චස් 20ක භූමි ප්‍රමාණයක් සභාව වෙත පවරා ගැනීමට තීරණය විය.

**යෝජනා අංක 6:7**

අකුරුගොඩ ප්‍රජා මණ්ඩලය යෝජනා කර ඇති පරිදි අකුරුගොඩ කොට්ඨාසය තුළ අයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ආයුර්වේද සායන මධ්‍යස්ථානය රෝගීන් පරීක්ෂා කිරීම හා ඖෂධ ලබා දීම ඇතුළුව සතියට දින දෙකක් අකුරුගොඩ ප්‍රගති ගොඩනැගිල්ල තුළ පැවැත්වීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:7**

අකුරුගොඩ ප්‍රජා මණ්ඩලය යෝජනා කර ඇති පරිදි අකුරුගොඩ කොට්ඨාසය තුළ අයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ආයුර්වේද සායන මධ්‍යස්ථානය රෝගීන් පරීක්ෂා කිරීම හා ඖෂධ ලබා දීම ඇතුළුව සතියට දින දෙකක් අකුරුගොඩ ප්‍රගති ගොඩනැගිල්ල තුළ පැවැත්වීමට තීරණය විය.

**යෝජනා අංක 6:8**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 117-1-001-3-7906568 අංක දරන ජංගම ගිණුමේ පවත්නා මුදලින් කෝටියක මුදලක් මාස 4ක කාලයක් සඳහා රජයේ බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස ආයෝජනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය අංක 6:8**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 117-1-001-3-7906568 අංක දරන ජංගම ගිණුමේ පවත්නා මුදලින් කෝටියක මුදලක් මාස 4ක කාලයක් සඳහා රජයේ බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස ආයෝජනය කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:9**

ඇල්ගිරිය කොට්ඨාසයේ ඇල්ගිරිය වසමේ බිබුල කඩේ අසල සිට නැදුරුගොඩ දක්වා මාර්ගයේ වලවල් හැරී ගමන් කිරීම අපහසු තත්ත්වයට පත්ව ඇත. එම මාර්ගය පස් දමා සකස් කර ගැනීමට බැකෝ යන්ත්‍රය සහ ට්‍රැක්ටර් දෙකක් ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:9**

ඇල්ගිරිය කොට්ඨාසයේ ඇල්ගිරිය වසමේ බිබුල කඩේ අසල සිට නැදුරුගොඩ දක්වා මාර්ගයේ වලවල් හැරී ගමන් කිරීම අපහසු තත්ත්වයට පත්ව ඇත. එම මාර්ගය පස් දමා සකස් කර ගැනීමට බැකෝ යන්ත්‍රය සහ ට්‍රැක්ටර් දෙකක් ලබා දීමට තීරණය විය.

**යෝජනා අංක 6:10**

ප්‍රධාන ලේකම්ගේ අංක CSS/9/10/11 හා 2022.09.26 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති පරිදි රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය- රාජ්‍ය ආයතනවල ගොඩගැසී ඇති අබලි

ද්‍රව්‍ය අපහරණය යටතේ අබලි ද්‍රව්‍යවල වටිනාකම තක්සේරු කිරීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

- **එච්.එච්.අසංකා කුමාරි මිය- ලේකම්- මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
- **බී.ඒ.කුමුදු ශාන්ත මයා - තාක්ෂණ නිලධාරී- මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
- **චන්දිකා මිය - විමර්ශන නිලධාරී- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය**

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:10</u>**

ප්‍රධාන ලේකම්ගේ අංක CSS/9/10/11 හා 2022.09.26 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති පරිදි රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය- රාජ්‍ය ආයතනවල ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය අපහරණය යටතේ අබලි ද්‍රව්‍යවල වටිනාකම තක්සේරු කිරීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට තීරණය විය.

- **එච්.එච්.අසංකා කුමාරි මිය- ලේකම්- මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
- **බී.ඒ.කුමුදු ශාන්ත මයා - තාක්ෂණ නිලධාරී- මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
- **චන්දිකා මිය - විමර්ශන නිලධාරී- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය**

**<u>යෝජනා අංක 6:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ප්‍රජා ශාලාවන්හි පෙර පාසල් පවත්වාගෙන යාමේදී එකී දේපල තවදුරටත් සංවර්ධනය කිරීමට පෙර තක්සේරුගත බදු කුලියක් මාසිකව අය කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් දැනුම් දී ඇත. ඒ අනුව සියලුම ප්‍රජා ශාලා තක්සේරු කිරීමටත්, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය සඳහා බදු පදනම මත ලබා දීමට අපේක්ෂිත තෙලිජ්ජවිල පිහිටි මාලිම්බඩ ප්‍රාදේශීය සභා පැරණි කාර්යාලය තක්සේරු කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ප්‍රජා ශාලාවන්හි පෙර පාසල් පවත්වාගෙන යාමේදී එකී දේපල තවදුරටත් සංවර්ධනය කිරීමට පෙර තක්සේරුගත බදු කුලියක් මාසිකව අය කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් දැනුම් දී ඇත. ඒ අනුව සියලුම ප්‍රජා ශාලා තක්සේරු කිරීමටත්, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය සඳහා බදු පදනම මත ලබා දීමට අපේක්ෂිත තෙලිජ්ජවිල පිහිටි මාලිම්බඩ ප්‍රාදේශීය සභා පැරණි කාර්යාලය තක්සේරු කිරීමටත්

**<u>යෝජනා අංක 6:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් නව කඩ සංකීර්ණයේ ඉහළ මාලයේ කඩ කාමර සඳහා පිවිසීමට තවත් යකඩවලින් නිම කරන ලද පියගැටපෙළක් මිළ කැඳවීමක් මත ඉදි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් නව කඩ සංකීර්ණයේ ඉහළ මාලයේ කඩ කාමර සඳහා පිවිසීමට තවත් යකඩවලින් නිම කරන ලද පියගැටපෙළක් මිළ කැඳවීමක් මත ඉදි කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:13**

පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රතිපාදන මත ඉදිකරන ලද ගොඩනැගිලිවල වහලය සකස් කිරීමට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත වටිනාකමින් 50% ක් පළාත් පාලන අමාත්‍යාංශයෙන්ද ඉතිරි මුදල් සභා අරමුදලින්ද ගෙවීමේ පදනම මත පහත ඇස්තමේන්තු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

| ස්ථානය | ඇස්තමේන්තුගත වටිනාකම |
|---|---|
| ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාව | රු.1, 546,147.00 |
| මාලිම්බඩ සතිපොළ ගොඩනැගිල්ල ඉහළ මාලය | රු.4,720,000.00 |
| මාලිම්බඩ ප්‍රාදේශීය සභා වාහන අංගනය | රු.2,966,394.00 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:13**

පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රතිපාදන මත ඉදිකරන ලද ගොඩනැගිලිවල වහලය සකස් කිරීමට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත වටිනාකමින් 50% ක් පළාත් පාලන අමාත්‍යාංශයෙන්ද ඉතිරි මුදල් සභා අරමුදලින්ද ගෙවීමේ පදනම මත පහත ඇස්තමේන්තු අනුමත කිරීමට තීරණය විය.

| ස්ථානය | ඇස්තමේන්තුගත වටිනාකම |
|---|---|
| ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාව | රු.1, 546,147.00 |
| මාලිම්බඩ සතිපොළ ගොඩනැගිල්ල ඉහළ මාලය | රු.4,720,000.00 |
| මාලිම්බඩ ප්‍රාදේශීය සභා වාහන අංගනය | රු.2,966,394.00 |

**යෝජනා අංක 6:14**

2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ දකුණු පළාත් සභාවේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු.456,500.00ක මුදලක් ලැබී ඇතත් පහත සඳහන් කර්මාන්ත මෙතෙක් ක්‍රියාත්මක නොකිරීම මත විගණන ගැටලු මතුවී ඇති බැවින් මේවා සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

| මාර්ගය | වෙන් වූ මුදල |
|---|---|
| - තෙලිජ්ජවිල පාතේගම ඕකන්දයාය ප්‍රවේශ මාර්ගය | රු.31500.00(2017) |
| - උනින්දුවෙල ග්‍රාම නිලධාරී වසමට අයත් බෝගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | රු.50000.00(2018) |
| - තෙලිජ්ජවිල කැකුණවෙල සුජාතා පෙර පාසලේ ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම | රු.25000.00(2018) |
| - ජයබෝධි විහාරස්ථානයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය | රු.50000.00(සෘජු ශ්‍රමික) |
| - වෙනිඅකුල II පටුමග මාර්ගයට පැති බැම්ම ඉදිකිරීම | රු.200,000.00 |

- අලපලාව කෘෂිවේල්ල
- අළුත්හේන පාර
- අකුරුගොඩ ශාන්තිවත්ත පාර

} සෘජු ශ්‍රමික රු.100,000.00

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:14</u>**

ඉහත සඳහන් කර්මාන්ත ක්‍රියාත්මක කරලීම සම්බන්ධව තාක්ෂණ නිලධාරීන් මගින් වාර්තාවක් ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:15</u>**

මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහජන සෞඛ්‍ය වැඩසටහන් සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය, මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ඉල්ලීම් කරන අවස්ථාවලදී නිකුත් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:15</u>**

මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහජන සෞඛ්‍ය වැඩසටහන් සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය, මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ඉල්ලීම් කරන අවස්ථාවලදී නිකුත් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:16</u>**

මාරගහහේන රබර්වත්ත මාර්ගයේ, මාර්ගයට අවහිර ගස් ඉවත් කිරීමටත්, මාර්ගයට සම්බන්ධ අතුරු කොටසක් සංවර්ධනය කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:16</u>**

මාරගහහේන රබර්වත්ත මාර්ගයේ, මාර්ගයට අවහිර ගස් ඉවත් කිරීමටත්, මාර්ගයට සම්බන්ධ අතුරු කොටසක් සංවර්ධනය කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:17</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් වෙනිඅකුල ප්‍රජාශාලාවට කොටසක් එකතු කිරීමට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:17**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් වෙනිඅකුල ප්‍රජාශාලාවට කොටසක් එකතු කිරීමට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:18**

අකුරුගොඩ ශාන්තිවත්ත ඉඩම 01 වන පටුමග මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සිමෙන්ති කොට්ට 15ක් ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:18**

අකුරුගොඩ ශාන්තිවත්ත ඉඩම 01 වන පටුමග මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සිමෙන්ති කොට්ට 15ක් ලබාදීමට තීරණය විය.

**යෝජනා අංක 6:19**

තෙලිජ්ජවිල සමරසිංහාරාම විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම් ලිපිය අනුව දහම්පාසල් භූමියේ ඇති මදුරුවන් බෝ වන ස්ථානය පස් දමා වසා දැමීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:19**

තෙලිජ්ජවිල සමරසිංහාරාම විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම් ලිපිය අනුව දහම්පාසල් භූමියේ ඇති මදුරුවන් බෝ වන ස්ථානය පස් දමා වසා දැමීමට තීරණය විය.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

2022/09/13 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/09/23 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/10/11 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

2022/06/28 දින පැවති තාක්ෂණික සේවා කාරක සභා කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/07/07 දින පැවති තාක්ෂණික සේවා කාරක සභා කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/08/02 දින පැවති තාක්ෂණික සේවා කාරක සභා කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

2022 අගෝස්තු මස ලැබීම් හා ගෙවීම් සාරාංශ වාර්තා සභාව වෙත ඉදිරිපත් කිරීම.

**9). වෙනත් කරුණු -**

**ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා**

මාලිම්බඩ ගල්පමුණ වසමේ ඉඩමක් වෙන්දේසි කිරීමට සූද්ද කරමින් යනවා.තාම සභාව දැනුවත් නෑ මං හිතන්නේ.ඒ නිසා මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරල සොයා බලන්න කියල ඉල්ලනවා.එතන අක්කර ගානක් තියෙනවා.
ඒ වගේම තමයි සභාපතිතුමා ජයමිණි හාඩ්වෙයාර් එක ළඟ ඉඳල මැජස්ටික් කෝඩ් එකට යන පාරේ මීටර් 10 ක් 15ක් විතර ඉතිරිවෙලා තියෙනවා අපිට හදාගන්න. එතන වාහනයක්වත් යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. අපේ තාක්ෂණ නිලධාරියෙක් යවල කොපමණ මුදලක් යනවද කියල ඇස්තමේන්තු කරල ඒ ටික සභා අරමුදලින් හදා දෙන්න කියල ජනතාවගේ ඉල්ලීමක් තියෙනවා.ඒ නිසා අවශ්‍ය බඩු ටික අරන් දෙන්න කියලා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>**

අපේ පැරණි ගම් සභා කාර්යාලය අපි අලුත්වැඩියා කළා. ඇන් අවුරුදු 4 කට වැඩියි.එක්වරක් අපි පිරිසිදු කළා. දැන් නැවත වල් බිහි වෙලා තියෙනවා. ප්‍රා දේශීය ලේකම් කාර්යාලයට අයිතිය තියෙයි කියල අපිට ඒකෙ කිසිම දෙයක් කරන්න දුන්නෑ. ලයිට් වතුර ලබා ගන්න බැරිවුණා. ඊට පස්සෙ අපේ කොට්ඨාසෙ නිලධාරීන්ට ලබා දෙන්න හැදුවා.ඒකත් කරන්න බැරිවුණා. අපේ කාල සීමාව අවසන් වෙනකන් අපට කිසි දෙයක් කරගන්න බැරි වෙනවා.මිනිස්සුන්ගෙ දෝෂාරෝපණය තියෙනවා අපි මේක සොයා බලන්නෙ නෑ කියලා.ඒ නිසා ප්‍රා දේශීය ලේකම් කාර්යාලයත් එක්ක කතා කරල මොනවහරි වැඩපිළිවෙළකට යමු. ඡන්දයක් ආවොත් ඡන්දයක් තියාගන්න බැරි තත්ත්වයක් එතන තියෙන්නෙ. සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම්තුමා එක්ක කතා කරල මේකට විසඳුමක් දෙන්න.

**<u>ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය</u>**

පන්නිගල පොකුණ එහා පැත්තෙ ලොකු කොහිල වලක් තියෙනවා.ඒ කොහිල වල නිසා පොකුණෙ කිවුල බැඳිලා. පොකුණ සුද්දකරල දෙන්න කියල ප්‍රදේශවාසීන් ඉල්ලීමක් කරල තියෙනවා. ඒ ඉල්ලීම ඉටු කරල දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

**<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>**

කද්දුව සිට බෙල්පගෙවත්ත හරහා මිදිගොඩ මාර්ගයේ අපි දිගටම කොන්ක්‍රීට් කරල තියෙනවා.ඒ වුණාට ඒ අතර එක් ස්ථානයක් තියෙනවා වාහනයක තියා පයින්වත් යන්න බැරි.එතනට සිලින්ඩර 2ක් දාලා තියෙනවා. 10m ක පමණ ප්‍රමාණයක වතුර රැඳෙනවා. අපි ලක්ෂ ගණන් වියදම් කළත් වැඩක් නෑ ඒ පාරට. ඒ නිසා සිලින්ඩර 2ක් දාලා එතන සකස් කරල දෙන්න කියල ඉල්ලනවා.

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

මේ වෙනකොට සභා වාර්තාවට ඇතුළත්වෙලා තියෙනවා සභාවේ මුදල් වියදම් කිරීම් විශාල වශයෙන්.ඒ කියන්නෙ ලක්ෂ 25 යෝජනා හතරක් වගේ සහ ලක්ෂ 10 යෝජනා 2ක් විතර ඇවිත් තියෙනවා. සුභ සාධන හෝ වෙනත් කාරණා යටතේ මුදල් වෙන් කරල තියෙනවා. කෘෂිකර්මාන්තය යටතේ පහුගිය දවසේ ලක්ෂ 25ක් වෙන් කළා.ඊට පස්සෙ දිළිඳු පවුල්වල ළමයි වෙනුවෙන් මුදල් වෙන් කළා.ඒ වගේ කෝටියට එහා මුදලක් සභා වාර 5ක් තුළ වෙන් කරල තියෙනවා. අයවැයට එහා ගිහින් සභා ගිණුමේ මුදල් වියදම් කරන්න තමයි මේ වියදම් දාලා තියෙන්නෙ.හැම මාසෙකට සභාවට මුදල් වියදම් කිරීමට දාලා තියෙනවා.අපේ ආදායමත් එක්ක මට පේන විදියට මේක දරාගන්න පුලුවන්කමක් නෑ. තව මාස 4ක් මේ විදියට ගියොත් සභාවේ පොදු වැඩ ටික කර ගැනීමට සභා අරමුදලේ සත 5ක් වත් ඉතිරිවෙන එකක් නෑ. ඒ නිසා ලබන සභාව වෙනකොට සභා අරමුදලේ මුදල් කීයක් තියේද? වියදම් කරන්න අනුමත

කරපු මුදල් කොපමණ තියේද? ඒ ටික ගියාම තවදුරටත් සභා අරමුදලේ කොපමණ මුදලක් ඉතිරිවෙලා තියේද? කියලා වාර්තාවක් ඉදිරිපත් කරන්න කියල සභාපතිතුමාගෙන් මම කාරුණිකව ඉල්ලනවා.ලේකම්තුමියත් මේක වගකීමකින් කරන්න කියල ඉල්ලනවා.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව